"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத், மார்க்கஸ் பெனாண்டோ மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya",32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone } 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. } CSO/FIN/2/3/6 (1)    ඔබේ අංකය. / உமது இல. / Your No. }    දිනය. / திகதி. / Date. } 2015.08.24

## <u>මූල්‍ය චක්‍රලේඛ 09/2015</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

### <u>රාජ්‍ය ආයතනවල අබලන්වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 2015.07.10 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 02/2015 සංශෝධන සහිතව බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

02. 2015 ප්‍රතිශෝධිත අයවැයෙහි ආදායම් යෝජනා 8.51 අනුව රාජ්‍ය ආයතන සතු අබලන්වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කල යුතුය. ඒ අනුව මෙම කරුණ වහාම අවධානයට යොමු විය යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙසින් හඳුනාගෙන මූල්‍ය රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව රාජ්‍ය ආයතනවල අබලන්වූ වාහන අපහරණය කිරීම සම්බන්ධව උපදෙස් හා ක්‍රමවේද පැහැදිලි කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව අපහරණය කල යුතු යැයි හඳුනා ගන්නා වාහන මෙම චක්‍රලේඛය නිකුත් කල දින සිට මාස 03 ඇතුලත අපහරණය කර අවසන් කිරීම සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ/ ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වේ. මෙම චක්‍රලේඛය යටතේ අපහරණය සඳහා හඳුනා ගනු ලබන වාහන යන්නට මෙහි 05 ඡේදය යටතේ හඳුනාගනු ලබන මෝටර් වාහන, බස්රථ, ලොරිරථ, ගිලන්රථ, ට්‍රැක්ටර්, ට්‍රේලර්, ඉඩම් වාහන ඇතුලු අනෙකුත් සියළු වාහන ඇතුලත් වේ.

04. **අපහරණය කල යුතු වාහන හඳුනා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලය.**

"රාජ්‍ය වියදම් කළමණාකරනය - 2015 මූල්‍ය වර්ෂය" මැයෙන් අයවැය චක්‍රලේඛ අංක 04/2015 හි 05 ඡේදය යටතේ ලබා දී ඇති උපදෙස් අනුව අපහරණය කල යුතු වාහන හඳුනා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක්/මණ්ඩලයන් පත් කල යුතුය. එහි සංයුතිය පහත පරිදි වේ.

I. සභාපති- ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු
II. යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්/කාර්මික නිලධාරියෙක්
III. ආයතනයේ වත්කම් සම්බන්ධයෙන් වගකීම දරණ මාණ්ඩලික නිලධාරියෙකු.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ / உள்ளகக் கணக்காய்வுப் பணிப்பாளர் / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dsplancs@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689900<br>dsengcs@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |

05. අපහරණය කල යුතු වත්කම් හඳුනා ගැනීම.

(අ). ඉහත 04 පරිදි අපහරණය කරන වාහන හඳුනා ගැනීම සඳහා පත් කරන ලද විශේෂ සමීක්ෂණ මණ්ඩලය විසින් ආයතනයේ වාහන පහත සඳහන් කාණ්ඩ යටතේ වර්ගීකරණය කල යුතු අතර තාක්ෂණ වාර්තාවක් මගින් ඒ ඒ කාණ්ඩය යටතේ අපහරණය කල යුතු වාහන නිශ්චය කර ගත යුතුය.

I. කාණ්ඩය - සුන්බුන් ලෙස පවතින වාහන
II. කාණ්ඩය - ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන
III. කාණ්ඩය - ධාවන තත්ත්වයේ පවතින එහෙත් භාවිතය ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන හා වෙනත් විශේෂ කරුණු මත අපහරණය සඳහා හඳුනාගත් වාහන.

(ආ) මෙම චක්‍රලේඛය යටතේ අපහරණය කල යුත්තේ ලියාපදිංචි කල දින සිට වසර 10 ඉක්මවා ඇති වාහන පමණි. කෙසේ වුවද, ඉහත 05 "අ" හි I කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද වාහන සම්බන්ධව මෙම වසර 10 සීමාව අදාල නොවේ. තවද, ඉහත 05 "අ" හි II හා III කාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද වසර 10 නොඉක්මවූ වාහන අපහරණය කල යුතුයැයි ඉහත 04 පරිදි පත් කරන ලද විශේෂ කමිටුව නිර්දේශ කලහොත් ඒවා මාගේ අනුමැතිය මත අපහරණය කල හැක.

(ඇ) අයවැය චක්‍රලේඛ අංක 04/2015 හි 05 ඡේදය යටතේ හඳුන්වාදී ඇති ආකෘතිය (ආකෘති අංක 01) අනුව ප්‍රධාන ලේකම් වෙත මෙතෙක් වාහන අපහරණය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් නොකරන ලද ආයතන විසින් 2015.09.30 දිනට පෙර එම තොරතුරු ඉදිරිපත් කල යුතු ය. යම් කිසි ආයතනයක අපහරණය කල යුතු වාහන නොමැති නම් ඒ බවද අනිවාර්යයෙන්ම නියමිත දිනට පෙර මා වෙත වාර්තා කල යුතු බව අවධාරණය කරමි.

06. අපහරණය කරන වාහන තක්සේරු කිරීම සඳහා වන මණ්ඩලය

අපහරණය කිරීමට නියමිත වාහන තක්සේරු කොට, ඒවායේ අවම විකුණුම් මිල නියම කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් කමිටුවක් පත් කල යුතුය. අවම වශයෙන් තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුතු මෙම කමිටුවට පහත I, II හා III හි දක්වා ඇති නිලධාරීන් අනිවාර්යයෙන් ඇතුලත් විය යුතු අතර අවශ්‍ය වන විට IV හි සඳහන් නිලධාරීන් ඇතුලත් කර සාමාජික සංඛ්‍යාව උපරිම වශයෙන් 05 දක්වා වැඩි කර ගත හැකිය.

I. සභාපති- ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු (දීප ව්‍යාප්ත සේවයක 1 පන්තියේ නිලධාරියකු / පළාත් අධිකාරි වන විට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු)

II. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර්රථ පරීක්ෂකවරයෙක්

III. යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්/තාක්ෂණික නිලධාරියෙක්

IV. අවශ්‍යතාවය පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් පත් කරනු ලබන වෙනත් නිලධාරීන් දෙදෙනෙකු.

07. වාහන අපහරණය කිරීම

(අ). ඉහත 05 පරිදි හඳුනාගනු ලැබ ඇති වාහන අපහරණය කල යුත්තේ, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතියට යටත්ව විවෘත මිල ගණන් කැඳවීම මගිනි. මේ පිළිබඳව මිලදී ගැනීම සඳහා වන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල විසින් අදාල ප්‍රසම්පාදන සීමාවන් තුල කටයුතු කරනු ලැබිය යුතුය. කෙසේවුවද, විවෘත මිල ගණන් කැඳවා අපහරණය කිරීම අසීරු වන අවස්ථාවලදී පමණක් රජයට මූල්‍යමය අවාසියක් නොවන පරිදි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට තීරණය කල හැකිය.

(ආ) ඉහත අංක 04 යටතේ පත් කරන ලද විශේෂ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් හා ආයතනයේ සාමාන්‍ය රාජකාරිවලට අවශ්‍ය වාහන සංචිතයට බාධාවක් නොවන පරිදි ඉහත අංක 05 යටතේ හඳුනා ගන්නා වාහන අපහරණය සිදු කල යුතුය. කෙසේ වුවද පළාත් සභා යටතේ පවතින අධිකාරිවල වාහන අපහරණය සම්බන්ධයෙන් වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව එම ඉල්ලීම අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර අවසාන තීරණය ලබා ගත යුතුය.

## 08. අපහරණය කරන වාහන හඳුනා ගැනීම සඳහා පත් කරන විශේෂ සමීක්ෂණ මණ්ඩලය හා තක්සේරු කිරීමේ මණ්ඩලයට කරන ගෙවීම.

මෙම කාර්ය සඳහා පත් කරන විශේෂ සමීක්ෂණ මණ්ඩලය සහ වාහන තක්සේරු කිරීමේ මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවීමට නියමිත ගාස්තු පහතින් දක්වා ඇත. අදාල ආයතන විසින් මෙම ගාස්තු ගෙවීම සිදු කල යුතුය.

| අනු අංකය | වාහන පංතිය (2009 අංක 08 මඟින් සංශෝධිත මෝටර් රථ වහන පනතේ 122 වැනි වගන්තිය දක්වා ඇති පරිදි) | එක් වාහනයකට එක් සාමාජිකයෙක් සඳහා (රු) | |
|---|---|---|---|
| | | 1 කාණ්ඩය | 11, 111 කාණ්ඩ |
| 01 | සැහැල්ලු මෝටර් සයිකල්- ඒ 1<br>මෝටර් සයිකල්- ඒ<br>මෝටර් ට්‍රයිසිකල් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් - බී 1 | 100/= | 250/= |
| 02 | ද්විත්ව කාර්ය වාහන හා සියළුම මෝටර් කාර් රථ - බී<br>සැහැල්ලු මෝටර් ලොරි - සී 1<br>අත් ට්‍රැක්ටර්- ජී 1<br>කෘෂි කාර්මික ඉඩම් වාහන -ජී<br>මෝටර් ලොරි -සී<br>බර මෝටර් ලොරි- සීඉ<br>මෝටර් කෝච්-ඩී<br>බර මෝටර් කෝච්- ඩීඉ<br>විශේෂ කාර්ය වාහන (ඉදි කිරීම් සඳහා භාවිතා වන)-ජේ | 200/= | 500/= |

## 09. වෙන්දේසිකරුවන්ගේ සේවය ලබා ගැනීම

එක් ආයතනයකට අපහරණය කිරීමට නියමිත වාහන සංඛ්‍යාව 50 ඉක්මවන විටකදී හා වාහන අපහරණය සඳහා ලියාපදිංචි වෙන්දේසිකරුවන්ගේ සේවය අවශ්‍ය වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පෞද්ගලිකවම තහවුරු කරන්නේ නම් පමණක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ඒ සඳහා සුදුසු එවැනි වෙන්දේසිකරුවකු තෝරාගෙන වාහන වෙන්දේසි කිරීමේ කටයුතු කල හැකිය.

## 10. වාහන අපහරණය පිළිබඳ පොදු උපදෙස්

(අ) යම්කිසි වාහනයක ලියාපදිංචි අයිතිය ආයතනයේ නමට නොපවතින අවස්ථාවක එවැනි වාහනවල අයිතිය ආයතනය වෙත ලියාපදිංචි කිරීමෙන් අනතුරුව පමණක් අපහරණ ක්‍රියාවලියට ඇතුලත් කල යුතුය.

(ආ) තීරු බදු රහිතව හෝ වෙනත් විශේෂ කොන්දේසි යටතේ ආනයනය කරන ලද වාහන වෙනම්, එම කොන්දේසි නිසි පරිදි අවලංගු කර ගැනීමෙන් අනතුරුව පමණක් අදාල වාහන අපහරණ ක්‍රියාවලියට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු අතර එවැනි තීරු බදු රහිතව ආනයනය කරන ලද වාහන ආනයනය කරන ලද වාහන මිලදී ගනු ලබන පාර්ශවයන් විසින් ඊට අදාල බදු මුදල් ගෙවිය යුතු බව අපහරණ දැන්වීම්වල පැහැදිලිව සඳහන් කල යුතුය.

(ඇ) සුන්බුන් ලෙස අපහරණය කිරීම සඳහා හඳුනා ගනු ලබන වාහන අපහරණය කිරීමට මත්තෙන් එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීමට මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් මඟින් කටයුතු කල යුතුය.

(ඈ) අපහරණ ක්‍රියාවලිය අවසානයේ මෙම වාහන මිලදී ගන්නා බාහිර පාර්ශවයන්ට බාධාවකින් තොරව වාහනයේ අයිතිය පවරා දීම අදාල වාහන අපහරණය කරන ලද ආයතන ප්‍රධානියාගේ වගකීමක් වන අතර අපහරණය කරන දිනය දක්වාම අදාල වාහන වලට ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබිය යුතුය.

(ඉ) වාහනයේ නීත්‍යානුකූල අයිතිය දරණ ආයතනය මේ වන විට වසා දමා ඇත්නම් එම ආයතනය වසා දැමීමේ කටයුතු සිදු කරන ආයතනය විසින් වාහනය පවරා දීම සම්බන්ධයෙන් කටයුතු කල යුතුය. වසා දැමීමට අදාල කටයුතු සිදු කරන ආයතනය අවිනිශ්චිත අවස්ථාවකදී වර්තමානයේ වාහනයේ පරිහරණ අයිතිය දරණ ආයතනය අයත් අමාත්‍යාංශය විසින් පවරාදීමට අදාල කටයුතු සිදු කල යුතුය.

(ඊ) අපහරණය සඳහා හඳුනාගනු ලබන වාහන තක්සේරු කිරීමෙන් පසුව එකී වාහන වල ආරක්ෂාව පිළිබඳව විශේෂ වැඩපිළිවෙලක් යෙදිය යුතුය. එහිදී ආයතන ප්‍රධානියා විසින් ඒ සඳහා වගකිව යුතු නිලධාරියකු නම් කර එහි නිශ්චිත වගකීම ඔහු වෙත පවරා දීම සුදුසුය.

(උ) අපහරණය කරන වාහනයේ අයිතිය සම්බන්ධව තව දුරටත් අවිනිශ්චිත අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ/ප්‍රධාන ලේකම් කාර්යාලයේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කල යුතුය.

(ඌ) සාමාන්‍ය වෙළඳපොලේ නිෂ්කාශනය කිරීම යෝග්‍ය නොවන එනම් විශේෂ ආරක්ෂක, වෙඩි නොවදින වැනි සුවිශේෂ පහසුකම් සහිත වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ අපහරණය කල යුතුය.

(එ) වාහන අපහරණ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව අවශ්‍යවන අවස්ථාවන්හිදී සහාය ලබා ගත යුතුවේ.

**11. වාහන පැවරීම හා විකුණුම් ආදායම පිළිබඳ උපදෙස්**

සාර්ථක ලංසුකරුවන් වෙත වාහන පැවරීම සිදු කල යුතු වන්නේ සම්පූර්ණ මුදල අය කර ගැනීමෙන් පසුව වන අතර මෙම ක්‍රියාවලිය යටතේ වන සියළුම ආදායම් නියමිත පරිදි පළාත් අරමුදලට බැර කල යුතුය. එසේම මෙම කාර්යය නිම කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ආකෘති අංක 02 පරිදි ප්‍රධාන ලේකම් වෙත 2015.12.31 දිනට පෙර ඉදිරිපත් කල යුතුය. එහි පිටපත් විගණකාධිපති, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත යොමු කල යුතු අතර පළාත් සභා යටතේ පවතින අධිකාරි වන විට අදාල අමාත්‍යාංශ ලේකම් වෙතද පිටපතක් යොමු කල යුතුය.

12. මෙම චක්‍රලේඛය යටතේ අපහරණය කරනු ලබන වාහන ප්‍රතිස්ථාපනය සඳහා අළුතින් වාහන ලබා දෙනු නොලැබේ.

13. මම චක්‍රලේඛයේ උපදෙස් පරිදි අපහරණ ක්‍රියාවලිය චක්‍රලේඛය නිකුත් කල දින සිට තුන් මසක් ඇතුලත ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදු කල යුතුය. මින් ඉදිරියට සෑම වසරකටම වරක් මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව වාහන අපහරණ ක්‍රියාවලිය සිදු කල යුතුය. එහිදී අපහරණය කල යුතු වාහන හඳුනා ගෙන ඒ පිළිබඳ තොරතුරු අදාල වර්ෂයේ මාර්තු 31 දිනට පෙර හා අපහරණ ක්‍රියාවලිය නිම කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව තොරතුරු අදාල වර්ෂයේ ජුනි 30 දිනට ප්‍රථම පිළිවෙලින් ආකෘති අංක 01 හා අංක 02 නියමිත පරිදි සම්පූර්ණ කර මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කල යුතුය.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.පරිගණක දත්ත ක්‍රියාකරු.

ආකෘති අංක:01

# රාජ්‍ය ආයතනවල අපහරණය කළයුතු වාහන හඳුනා ගැනීම.

අමාත්‍යාංශය:

දෙපාර්තමේන්තුව / ආයතනය:

| අනු අංකය | වාහන අංකය | වර්ගය/මාදිලිය | *ගැණුම් මිල | *මිලදී ගත් දිනය හෝ වර්ෂය | එන්ජින් ධාරිතාව | *ධාවනය කර ඇති දුර ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(*තොරතුරු පවතී නම් සඳහන් කරන්න)

සකස් කළේ:- ................................

පරීක්ෂා කළේ:- ................................

.......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම් අංක: 02

## රාජ්‍ය ආයතනයවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම

අමාත්‍යංශය:-

දෙපාර්තමේන්තුව/ ආයතනය:-

| අනු අංකය | වාහන අංකය | වර්ගය/මාදිලිය | වාහනයේ පැවති තත්ත්වය (කාණ්ඩ අංකය අනුව) | තක්සේරු වටිනාකම | අපහරණයෙන් ලද ආදායම | අපහරණය කරන ලද දිනය | මිලදීගත් අයගේ නම හා ලිපිනය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |